# බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ වෙනස්වීම්

## 5.2 කියවීම් පත්‍රිකාව

<u>බ්‍රිතාන්‍ය පාලන පාලනය නිසා ලංකාවේ ඇති වූ සමාජ වෙනස්වීම්</u>

- මධ්‍යම පන්තියක් බිහි වීම

බ්‍රිතාන්‍ය පාලන කාලය තුළදී මෙරට සිදුවූ සමාජ සිදුවූ සමාජ වෙනස් වීම් අතර පැරණි ප්‍රභූ පන්තියේ අභාවයට ගොස් නව මධ්‍යම පන්තිය බිහිවීම කැපී පෙනෙන ලක්ෂණයකි. නව ධනෝපායන මාර්ග තුලින් මුදල් උපයාගත් ව්‍යාපාරික පිරිස් ඉංග්‍රීසි අධ්‍යාපනයෙන් තනතුරු ලබාගත් උගත්තු පිරිසක් ද බිහි වූහ .මෙම පිරිස ආර්ථික තත්වයත් අතින් සෙසු ජනතාව අතර වෙසෙසින් කැපී පෙනෙන කොටසක් බැවින් ඔවුන් මධ්‍යම පන්තිය වශයෙන් හඳුන්වනු ලැබේ. විසිවන සියවස ආරම්භ වන මෙම මධ්‍යම පන්ති බිහිවීමත් සමග පැරණි ප්‍රභූ පන්තිය අභාවයට ගියේය .විසිවන සියවසේදී මෙරට දේශපාලන උද්ඝෝෂණ පෙරමුණ ගන්නා ලද්දේ එම මධ්‍යම පන්තිය විසිනි .උගත් මධ්‍යම පන්තිය වශයෙන් හඳුන්වන මෙම පිරිස බටහිර අධ්‍යාපනය තුළින් යම් සමාජ පත්තර ලබාගත් අය වේ. එබැවින් ඔවුහු බටහිර සංස්කෘතිය අනුගමනය කරන ධනවත් නගර වැසියන් පිරිසක් බවට පත් විය .

- කම්කරු පන්තියක් බිහි වීම

බ්‍රිතාන්‍ය පාලනය සමය තුළ ඇති වූ ආර්ථික වෙනස්කම් නිසා මෙරට කම්කරු පන්තියක් බිහි වීම ද කැපී පෙනෙන ලක්ෂණයකි. මෙරට සම්ප්‍රදායික පාලනය යටතේ රජයේ පොදු කටයුතු සඳහා අනිවාර්ය රාජකාරි ක්‍රමය යටතේ ශ්‍රමය ලබා ගත් බැවින් වැටුපට වැඩ කරන පිරිසක් බිහි නොවිණි .එහෙත් බ්‍රිතාන්‍ය පාලන කාලය උඩරට ප්‍රදේශවල වතු වගාව ආරම්භ වූ හෙයින් වතුවල සේවය කිරීමට කම්කරුවන් අවශ්‍යවිය. ඒ වන විට ඉන්දියාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බව ඇති බැවින් ඉතා අවම වැටුපකට දකුණු ඉන්දියාවෙන් කම්කරුවන් ගෙන්වා ගැනීම වඩාත් ලාභදායී විය. ඒ අනුව වතු කම්කරුවන් පිරිසක් මෙරට බිහිවිය. අලුතින් ඇති වූ ආර්ථික වෙනස්කම් නිසා කොළඹ, ගාල්ල ,මහනුවර වැනි නගරාශ්‍රිතව බඩු බෑම පැටවීම, රෙදි සේදීම ,කරත්ත මගින් භාණ්ඩ ප්‍රවාහනය, මංමාවත් හා දුම්රිය මාර්ග තැනවී, වැනි සේවා සඳහා ශ්‍රමිකයින් අවශ්‍ය විය .මේ නිසා ඉන්දියානු වතු කම්කරුවන්ට අමතරව නාගරික ප්‍රදේශ ආශ්‍රිතව ස්වදේශීය කම්කරු පිරිසක් බිහිවිය.